**ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 239 - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 17 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,785.84 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,562.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 223.18 ක් හෙවත් සියයට 8.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 351.38 | 218.52 | 132.86 | 37.81 |
| මූලධන | 2,434.46 | 2,344.14 | 90.32 | 3.71 |
| එකතුව | 2,785.84 | 2,562.66 | 223.18 | 8.01 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**---------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23901යටතේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5.00 | 4.74 | 3.00 | 3.78 | 27.00 | 19.57 |

**2.3 අග්‍රිම ගිණුම**

**--------------**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0133/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 1.83 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

**----------------------**

දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**---------------------------------------------**

**3.1 විසර්ජන ගිණුම**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 85.63 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක් හා සියයට 98 ක් වී තිබුණි.

(ඇ) වැය විෂයයන් 02 ක් සම්බන්ධ පුනරාවර්තන ස්වභාවයේ රු. 977,622 ක් වූ වියදම් මූලධන වියදම් ලෙස වර්ග කර දක්වා තිබුණි. ඒවා ඊට අදාල පුනරාවර්ථන වැය විෂයයන් යටතේ දරන ලද්දේ නම් එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉක්මවන බවද නිරීක්ෂණය විය.

(ඈ) අපහරණය යටතේ දක්වා තිබූ මෝටර් රථ හා පුද්ගල පරිඝණකවල වටිනාකම් පිළිවෙලින් රු. 5,744,371 ක් හා රු. 2,737,301 ක් සම්බන්ධයෙන් අපහරණයට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**3.2 වත්කම් කළමණාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, දෙපාර්තමේන්තුවේ එක් එක් අංශයන් භාවිතා කරනු ලබන වට්ටෝරුගත භාණ්ඩ අයිතමයන් සම්බන්ධව අදාල අංශයේ වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණ යටතේ භාණ්ඩ ලේඛනයක සටහන් කර යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබූ අතර භාණ්ඩ පහසුවෙන් හඳුනාගත හැකිවන පරිදි ගබඩාව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**3.3 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **ව්‍යවස්ථාපිත විධිවිධාන**<br>**1957 අප්‍රේල් 13 දිනැති අංක 29 දරන විදේශ ණය පනත හා එහි 1962 අංක 2, 1963 අංක 1 හා 1980 අංක 23 දරන සංශෝධනය**<br>3 වන වගන්තිය | ශ්‍රී ලංකා රජය විසින් ලබාගෙන ඇති සියළුම විදේශ ණය ඒකාබද්ධ අරමුදලෙන් ගෙවිය යුතු වුවද ඇතැම් විදේශ ණය මුදල් ආපසු ගෙවීම් අමාත්‍ය මණ්ඩල තීරණ මත රාජ්‍ය ව්‍යාපාර වෙත පවරා තිබුණි. |

**3.4 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළදී සංවර්ධන පාර්ශවකරුවන් 09 දෙනෙකුගෙන් ව්‍යාපෘති 60 ක් සඳහා එ.ජ.ඩො. මිලියන 4,490 ක බැඳීම් ඇතිකර ගැනීමට සැලසුම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී එ.ජ.ඩො.මිලියන 4,272 ක් වටිනාකමැති ව්‍යාපෘති 34 ක් සඳහා ණය ගිවිසුම්ද ව්‍යාපෘති 29 ක් සඳහා ප්‍රදාන ගිවිසුම්ද අත්සන් කිරීමට සමත් වී තිබුණි. 2016 වර්ෂයේදී ලෝක බැංකුවෙන් හා කොරියානු රජයෙන් පිළිවෙලින් ව්‍යාපෘති 6 ක් හා ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් එ.ජ.ඩො.මිලියන 456 ක් හා එ.ජ.ඩො.මිලියන 22 ක අරමුදල් අපේක්ෂා කරන ලද නමුත් පිළිවෙලින් එ.ජ.ඩො.මිලියන 256 ක් හා එ.ජ.ඩො.මිලියන 9 ක් පමණක් ලැබී තිබූ අතර එය සියයට 56 ක් හා සියයට 41 ක් විය.

(ආ) 2016 වර්ෂය තුළදී එ.ජ.ඩො.මිලියන 2,193 ක විදේශ මූල්‍යයන උපයෝජනයක් සැලසුම් කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වනවිට එය එ.ජ.ඩො.මිලියන 2,341 ක් වීම නිසා අපේක්ෂිත ප්‍රමාණයට වඩා සියයට 7 ක ප්‍රගතියක් අත්කර ගෙන තිබුණි. එසේ වුවද 2016 වර්ෂය තුළදී මැදපෙරදිග හා දකුණු ආසියා රටවලින් පිළිවෙලින් එ.ජ.ඩො. මිලියන 94 ක් හා එ.ජ.ඩො.මිලියන 120 ක් විදේශ මූල්‍යය උපයෝජනයට සැළසුම් කළද තථ්‍ය අගයන් පිළිවෙලින් එ.ජ.ඩො.මිලියන 35 ක් හා 44 ක් වූයෙන් එම මූල්‍යයනයන්ද අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 37 ක් හා සියයට 9.5 ක් විය.

(ඇ) 2016 කාර්යසාධන වාර්තාවට අනුව ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති 04 ක, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය අඩු මට්ටමක පැවති අතර එම ව්‍යාපෘතිවල කාලසීමාව අවසන්වීමට ආසන්න වී තිබුණි.

(ඇ) 2015 හා 2016 වර්ෂවල විදේශ මූල්‍යයන එකඟතාවලට එළඹ තිබූ ව්‍යාපෘති 07 ක් සඳහා විදේශීය මූල්‍යයනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.

**3.5 කළමණාකරණ දුර්වලතා**

**3.5.1 විදේශ ව්‍යාපෘති මූල්‍යයනය**

**උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය**

මුළු පිරිවැය එ.ජ.ඩො.මිලියන 548.15 නොඉක්මවන ඇස්තමේන්තුව යටතේ ඉරාන රජය විසින් සියයට 85ක්ද ශ්‍රී ලංකා රජය විසින් සියයට 15 ක්ද මූල්‍යනය කිරීමට යටත්ව අදාල මූල්‍යමය ගිවිසුම 2008 අප්‍රේල් 28 දින අත්සන් කර තිබුණි. මෙහි කොන්ත්‍රාත්කරු ලෙස ඉරාන සමාගමක් නම් කර තිබුණි. 2010 මාර්තු 15 දින සිට වසර 5කින් නිම කළ යුතුව තිබූ මෙම ව්‍යාපෘතියේ කාලය අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2018 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වනවිට ශ්‍රී ලංකාවට ඉරානයෙන් එ.ජ.ඩො.මිලියන 50 ක් පමණක් ලැබී තිබිණි. එදිනට ශ්‍රී ලංකා මුදල්වලින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 49,736.38 ක් වියදම් කර තිබුණි. එම මුදලින් ඉරාන ජාතික සමාගමට රු.මිලියන 44,337.36 ක් හා නිවාස ඉරිතැලීම්, ගිලාබැසීම් ආදිය සඳහා වන්දි මුදල් ලෙස රු.මිලියන 200.82 ක් ගෙවා තිබුණි.

(ආ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ මෙහෙවර වනුයේ ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දරාගත හැකි පිරිවැයක් සහිතව හා අවම කොන්දේසිවලට යටත්ව විදේශ ආධාර මූල්‍ය පහසුකම් යෙදවීම වේ. එසේවුවද මෙම ව්‍යාපෘතිය සඳහා විදේශ ආධාර ලබා ගැනීමේදී පහත දැක්වෙන කරුණු කෙරේ අවධානය යොමු නොකිරීම හේතුවෙන් මහජනතාවට භූගත ජල සංචිතය, ජීවනෝපාය හා තම වාසස්ථාන අහිමිවීම මෙන්ම උමඟ තුලින් ජල කාන්දුවීම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපහසුවීම වැනි දුෂ්කරතා රැසක්ද, රටට වැය බරක්ද එකතු කිරීමට සමත් වූ ජාතික ගැටළුවක් බවට පත්වී ඇති බව නිරීක්ෂණය විය.

(i) මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 3(2) (i) ආ පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කිරීමට පෙර එම ව්‍යාපෘතියට අදාලව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. එසේම ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වැනි ආයතනවලින් නිර්දේශ/අනුමැතීන් ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් සාමාන්‍යයෙන් ව්‍යාපෘති යෝජනාවක් විදේශ අරමුදල් සපයා ගැනීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අවස්ථාව වන විට මෙම පියවරයන් අදාළ රේඛීය අමාත්‍යාංශය මගින් අවසන් කර තිබිය යුතුවේ. එසේම මෙය ඔවුන්ගේ වගකීමක් වන බැවින් එම කටයුතු අවසන් කර ඇති බවට උපකල්පනය කර කටයුතු කළ බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවසා තිබුණි.

(iii) විදේශාධාර සඳහා සියළුම සාකච්ඡා පවත්වනු ලැබිය යුත්තේ ද, කවර හෝ ව්‍යාපෘතියක් හෝ කාර්යයක් සඳහා විදේශාධාර ලබාගත හැකිද යන්න පිළිබඳව සියළුම විමසීම් කළ යුත්තේද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බවට මුදල් රෙගුලාසි 610 ප්‍රකාරව බලතල පවරා තිබුණද ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් දෙපාර්තමේන්තුව විසින් යොමු කර නොතිබුණි.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අදාළ ණය සාකච්ඡා සම්මුතීන් අදාළ ණයහිමියන් සමඟ සිදුකරනු ලබයි. කෙසේ නමුත්, විදේශාධාර ලබා ගැනීමට අවශ්‍ය මූලික කරුණු සපුරා ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් වීමෙන් පසුව පමණක් විදේශාධාර ලබා ගත හැකි බවට වගන්තියක් හෝ පූර්ව කොන්දේසියක් මුදල් රෙගුලාසිවල දක්වා නොමැති බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවසා ඇත.

### 3.5.2 විදේශාධාර පරීක්ෂාව

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය අංක 2014034 - ප්‍රමුඛ මාර්ග වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරිම ව්‍යාපෘතිය 3-අදියර III සඳහා 2016 සැප්තැම්බර් මාසය අග සිට විදේශ අරමුදල් ලැබී තිබූ අතර දෙසැම්බර් 31 දින වනවිට (එ.ජ.ඩො. 14,855,169.17) රු.මිලියන 2,193.97 ක් ලැබී තිබුණි. එසේ වුවද, 2015 වර්ෂයේදී රු.මිලියන 121.45 ක්ද (එ.ජ.ඩො. 913,861) 2016 වර්ෂයේදී රු.මිලියන 528.44 ක්ද (එ.ජ.ඩො. 3,722,855.27) ණය පොළී ලෙස ගෙවා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ණය අරමුදල් නොලද ව්‍යාපෘති 03 කට අදාළව බැඳීම් ගත ගෙවීම් ලෙස (Commitment Fee) රු. මිලියන 124.47 ක් (යූරෝ 764,019) 2016 වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාපෘති අධීක්ෂණය සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කමිටු පිහිටුවා තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඒ සඳහා සහභාගිවීම තුළින් විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මකවීම අධීක්ෂණය කරන අතර රටේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වය සපයනු ලැබේ. කෙසේ නමුත්, ණය අංක 2009020 යටතේ සුදුසුකම් නොලත් වියදම ලෙස සළකන ලද රු.මිලියන 24.40 (එ.ජ.ඩො. 170,213.76) ක් 2016 ජූනි මස 08 වන දින ලෝක බැංකුව වෙත ආපසු ගෙවීමට සිදුවී තිබුණි. ණය අංක 2004045 යටතේ ලබාදී තිබූ අරමුදලින් දරා තිබූ ව්‍යාපෘතියට අදාල නොවන වියදමක් වශයෙන් සලකන ලද රු.මිලියන 241.11 ක්වූ ප්‍රාග්ධන මුදල සහ ඒ සඳහා වූ පොලිය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ( JICA) වෙත ගෙවීමට ද සිදුවී තිබුණි.

(ඈ) ණය ගිවිසුම් අත්සන් කර සැලකිය යුතු කාලයක් ගතව තිබුණු ව්‍යාපෘති 8 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඉ) 1984 අගෝස්තු 23 දිනැති අංක 33 දරන පනතින් විදේශ ණයක් යන්නෙහි අර්ථය සංශෝධනය වී තිබුණි. ඒ අනුව "ණය මුදලක්, ඕනෑම මූල්‍ය බැරකමක් හෝ පහසුකමක් " (Loan or any form or Financial credit or accommodation) ලෙස අර්ථ දක්වා තිබූ බැවින් ප්‍රදානයක් යන්නද ඊට ඇතුළත්ව පවතී. එබැවින් ප්‍රදාන සම්බන්ධයෙන්ද දත්ත ගබඩාව පවත්වා ගෙන යාමේ වගකීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සතු වේ. එනමුත් ශ්‍රී ලංකාවට ලැබෙන සියළු විදේශාධාර පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොපැවතුණි. එවැනි තත්ත්වයක් යටතේ එම ආධාර නීති රීති රෙගුලාසිවලට අනුකූලව කාර්යක්ෂම හා රටට උපරිම ඵලදාවක් ලැබෙන ආකාරයෙන් යොදවනවාද යන්න ගැටළු සහගත විය.

### 3.5.3 විදේශ පුහුණු අවස්ථා

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළ අයදුම්පත් නොලැබීම හා ඉදිරිපත් කරන ලද අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප වීම මත පිළිවෙලින් පුහුණු වැඩසටහන් 14 ක් හා 128 ක් ශ්‍රී ලංකාවට අහිමි වී තිබුණි. අදාල රේඛීය අමාත්‍යාංශ වෙතින් නාම යෝජනා කැඳවීම කරනු ලබයි. අනතුරුව ලැබෙන ඉල්ලුම්පත් අදාල සංවර්ධන පාර්ශවකරුවන් වෙත යවනු ලබන ඔවුන්ගේ තේරීම් නිර්ණායක මත සහ ශ්‍රී ලංකාවට වෙන්කර ඇති අවස්ථා ගණන අනුව මෙවැනි තත්ත්වයන් ඇතිවන බව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පවසා තිබුණි.

(ආ) ඉන්දියාව හා මැලේසියාව වැනි රටවල්වලින් පුහුණුලාභීන් ලෙස තේරී පත් වූ අය වෙත ඍජුව දැනුම් දෙනු ලබන බැවින් අදාල තේරී පත්වූවන්ගේ විස්තර ශිෂ්‍යත්ව ප්‍රදායක ආයතනවලින් ලබා ගැනීමට කටයුතු යොදා ඇති බව විගණනය වෙත දන්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන්දියාව හා මැලේසියාව යන රටවල පුහුණුවීම් සඳහා නම් කරන ලද නිලධාරීන් අදාල පුහුණුව සඳහා තේරී පත් වූයේද යන්න දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර ගෙන නොතිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

-------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 45 | 12 |
| (ii) | තෘතීක මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතීයික මට්ටම | 63 | 48 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 29 | 25 | 04 |
| | එකතුව | **153** | **121** | **32** |